# කන්නා



ලිතුම් චරින්‍යා කොඩිතුවක්කු

# කන්නා

ලිතුම් චරින්යා කොඩිතුවක්කු

# කන්නා

## කර්තෘ ෲ  ලිතුමි චරින්යා කොඩිතුවක්කු

**කර්තෘගේ වෙනත් කෘති**

| | |
|---|---|
| දගමලී | ( ISBN 978-624-208-069-7) |
| වුෂු සටන් කලාව | ( ISBN 978-624-208-712-2) |


මහා මායා බාලිකා විදුහල - මහනුවර

11 -B



2025-02-08

**ISBN :  978-624-208-802-0**

# පිදුම

මහාමායා බාලිකා විදුහලේ ගුරු

විදුහල්පතිතුමියටත්

පංතිභාර ගුරුතුමිය ඇතුළු

ආචාර්ය මණ්ඩලයටත්

මෙම ව්‍යාපෘති නිර්මාපක

සෙනවිරත්න ගුරුතුමාටත්

සැමදා මට දිරියක් වන මාගේ

දෙමාපියන්ටත්,

මගේ යහළුවන්ටත්

මෙම පොත ආදරයෙන්

පුදමි...

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජේන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය ක "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විදුහල
මහනුවර
2025-02-08

# පටුන


| | | |
|---|---|---|
| (1) | මුල් පිටුව | i |
| (2) | කර්තෘගේ වෙනත් කෘති | ii |
| (3) | පිදුම | iii |
| (4) | පෙරවදන | iv |
| (5) | පටුන | v |
| (6) | අන්තර්ගතය | 1-9 |

මගේ නම ප්‍රියා රාමසාමි,

මගේ පියා ද්‍රවිඩ ජාතිකයෙකි.

මගේ මව සිංහල බෞද්ධ කාන්තාවක් වූවාය.

මගේ ගම මහනුවර ප්‍රදේශයේ පිහිටි ගලහ නගරයට ආසන්න ඉතා කුඩා ගමකි. මා ඉගෙනුම ලැබුවේ දෙමළ පාසලකයි.

දෙමළ මාධ්‍යයෙන් උසස් පෙළ හදාරා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද  අවසන් කළෙමි.

ගුරු වෘත්තිය මා ඉතාමත් අසාකල රැකියාවකි.

ගුරු වෘත්තිය සඳහා ඉල්ලුම් කල මා හට පළමු පත්වීම ලැබුණේ නුවරඑළිය ප්‍රදේශයේ පිහිටි ඉතාදුෂ්කර පාසලකටය.

මා ඉතාමත් ආශාවෙන් පත්වීම භාරගෙන එහි ගියෙමි.
මට නවාතැන් ගැනීමට ලැබුණේ ප්‍රධාන විදුහල්පතිතුමාගේ නිවසේය. එහි මා සඳහා සියලු දේ සූදානම් කර තිබිණි.

පාසලේ දරුවන් හා ගුරුවරුන් මා ඉතාමත් සුහදව ඔවුන්ගේ පාසල වෙත පිළිගත්හ.

මා හට බාරව තිබුණේ එම පාසලේ 5 ශ්‍රේණියේ පන්තියයි. භාෂා 3 ම එනම් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි ඉතා චතුර ලෙස හැසිරවීමේ හැකියාව සහ ලිවීමටද කියවීමටද මා ඉතා දක්ෂ වූවෙමි.

ඒ නිසා එම දරුවන්ට ඉතා හොඳින් ඉගැන්වීමේ කටයුතු සිදු කිරීමට මා අදිටන් කර ගතිමි.

මාගේ එම පන්තියේ සිටියේ දරුවන් 20 ක් පමණය. ඔවුන් සියලු දෙනාම ද්‍රවිඩ දරුවෝ විය. මා එම පන්තියට යන විට ළමුන් සියලු දෙනාම ඉතා සතුටින් මා පිළිගනු ලැබුවා.

ඔවුන් සියලු දෙනාම මලක් බැගින් අතේ තබාගෙන ඒවා මා වෙත පිළිගැන්වූවා.

නමුත් එක් දරුවෙකු පමණක් පන්තියේ කොනක තනි මේසයක් ළඟ ඉතා අසරණව මා දෙස බලා සිටිනවා මා දුටුවා.
නමුත් මා එය එතරම් ගණනකට නොගෙන සුහදව සියලු දෙනාටම සුභ පතා මාගේ කතාව ආරම්භ කලා.

එහිදී මා ප්‍රාකශ කලේ පන්තියේ සියලු දෙනාටම මා එකම ආකාරයෙන් සලකන බවත්, ළමුන් සියලු දෙනාද ඉතා සමගිව සිටිය යුතු බවත් හා හොඳින් පාඩම් වැඩ කළ යුතු බවත්ය.

කිසිම දරුවෙකුට අගෞරව සිදුකිරීම, හිංසා කිරීම,අවමන් කිරීම, කිසිදු දවසක නොකල යුතු බවත් ඔවුන්ට තරයේ හා ආදරයෙන් ප්‍රකාශ කලා.

නමුත් මෙම පන්තියේදී විවිධාකාර ගති පැවැතුම් ඇති දරුවන් කිහිපදෙනෙකු සිටි අතර ''කන්නා'' ඒ අතරින් වෙනස්ම දරුවෙකි. ඒ දරුවා අර පන්තියේ වෙනම තැනක තනියම මේසයක සිටි දරුවා.

මම දරුවන්ට උගන්වන අවස්ථාවල නිතර ඔහු දෙස බලන්නෙමි.
ඔහු ද මා දෙස බලාගෙන සිටින අවස්ථා බොහෝයි.
ඔහු පාසලට පැමිණෙන්නේ ඉතා අපිරිසිදුවට
යි.

පාඩම් වැඩ කරන්නේ ද නැත.

ඔහුගේ කමිසය කහපාට වී ඇත.

සපත්තු යුවල කැඩී ගොස් ඇත.

එක සපත්තුවකින් කකුලේ ඇඟිලි එළියට මතු වී පෙනේ.

කොන්ඩයද වැවී ඇත.

ඔහු පන්තියේදී කිසිදු කතා බහක් සිදු නොකරයි

අසන ප්‍රශ්න සඳහාද උත්තර ලබා නොදේ.

ගෙදර වැඩ දුන් විට එයද කරගෙන නොපැමිණෙයි.

නමුත් ඔහු දිනපතා පාසලට වෙත පැමිණේ.

කිසිදු ආහාරයක්ද පන්තිය තුලදී ලබා නොගනී.

කිසිම ප්‍රශ්නයකට උත්තර නොදී බලාගත් අත බලා සිටින මේ දරුවා මටද මහත් වදයක් විය.

මෙම දරුවා මාගේ පන්තියේ ''නොසියානම් හොදයි'' යැයි මට කිහිප අවස්ථාවකම සිතුණි.

අවසානයේදී මා මේ ගැන පාසලේ ප්‍රධාන විදුහල්පතිතුමා වෙත දැනුම් දුනිමි.

ඔහු පිළිබඳ මාගේ සිතේ පැවැති අකමැත්ත ප්‍රකාශ කලෙමි. ඔහු නිසා අනෙකුත් ළමුන්ටද ඉගැන්වීමේ කටයුතු සිදුකල නොහැකි බවද පැවසුවා.

විදුහල්පතිතුමා මාගේ කතාව ඉතාමත් සාවධානව අසා සිටියා. ඔහු මා දෙස බලා තම අසුනෙන් නැගිට ගොස් පොත් අල්මාරිය ඇර යම් කිසි පොතක් රැගෙන නැවතත් ඔහුගේ අසුනේ වාඩිවුණා.

ඔහු මා වෙත එම පොත දිගු කර එය කියවා බලන්න යැයි පැවසුවා.

එය ප්‍රගති වාර්තා පොතකි.

එහි නම ''කන්නා මනෝහරන්'' ලෙසින්  සඳහන් වී තිබුණා.

එහි පිටු පෙරළා බැලීමේදී කන්නාගේ පළමු ශ්‍රේණියේ ගුරුවරිය ඔහු ගැන මෙසේ සදහන් කර තිබුණා. .

''කන්නා ඉතා දීප්තිමත් හා මිත්‍රශීලී දරුවෙකි.
ඔහුගේ දෙතොල් මත නිතරම සිනහව රැඳී ඇත.
සෑම කෙනෙකුටම ඔහු බොහෝ සේ ආදරය කරයි.
ඔහු තම වැඩ කොටස නියමිත වේලාවට ඉටුකර මා වෙත ලබා දෙයි.
ඔහු ඉතාමත් බුද්ධිමත් හා දක්ෂ දරුවෙකි.
ඔහු ඉතා පිරිසිදුව ඇඳුම් අඳියි.'
''ඔබ මාගේ පන්තියේ සිටීම මට සතුටක් ''

දෙවන ශ්‍රේණියේ ගුරුවරයා මෙසේ සඳහන් කර තිබුණා.

''කන්නා ඔහුගේ පන්තියේ මිතුරන් අතර ආදර්ශවත් ශිෂ්‍යයෙකි.
සියලු වැඩ හොඳින් සිදුකර අනෙක් අයටද උදව් කරයි.
නමුත් අවසාන මාසවලදී ඔහුගේ වැඩ අතපසු වූ අතර සොයා බැලීමේදී දැනගැනීමට ලැබුණේ ඔහුගේ අම්මා අසනීප වී ඇති බවත්, එම අසනීපය සුව කර ගත නොහැකි එකක් බවත්ය. එහෙයින් ඔහු ඉන්නේ ඉතාමත් දුකිනි ''
.

තුන්වන ශ්‍රේණියේ ගුරුවරයා සඳහන් කර තිබුණා

''කන්නාට ඔහුගේ මවගේ මරණය දරාගත නොහැකි වේදනාවක් විය.

පන්තියේදී හොදින් වැඩ කල දරුවා සෑම දෙයකටම උනන්දුව නැතිවී නිතරම හඬමින් කාලය ගත කරයි.
ඔහුගේ පියා ඔහු නොසලකා හැර ඇත තිබුණා
ඉගෙනීමේ කටයුතු සඳහාද පියාගෙන් සහයෝගයක් නොමැත. පියා ඔහුට ඉතා දරුණු ලෙස පහරදී ඇති බවට සලකුණු පෙනේ ''

හතරවන ශ්‍රේණියේ ගුරුවරිය සඳහන් කර තිබුණා.

''කන්නා ඔහුගේ පාඩම් වැඩ වලට කිසිම උනන්දුවක් නොදක්වයි.
ඔහු ඔහුටම ආවේණික වූ යම් යම් චර්යාවන් මත ජීවත් වේ .
මා ඔහුට උදව් කිරීමට උත්සාහ කරන විට හා ඔහුගෙන් කරුණු විමසන විට ඔහු දැඩි නිශ්ශබ්දතාවයෙන් මා දෙස බලා සිටියි.
ඔහු අපිරිසිදු ඇඳුම් අදියි. ඔහුගේ මිතුරන් ඔහුගෙන් ඈත් වී ඇති අතර ඔහු හුදකාලා වී ඇත . ''
යනුවෙනි.

එම වාර්තා පොත කියවීමෙන් අනතුරුව මාගේ දෑස් අගින් කඳුළු රූරා වැටෙන්නට විය.

මට මා ගැනම ලැජ්ජාවක් ඇතිවිය.
දරුවෙකුගේ මානසික මට්ටම තේරුම් ගැනීමට නොහැකි වූයේ මන්දැයි මාගේ සිත වද දෙන්නට විය.

මා කිසිත් කතා නොකර විදුහල්පතිතුමා වෙත පොත බාර දී නැවත මාගේ පන්තිය වෙත පැමිණියෙමි.

ඉන්පසුව මා කන්නා වෙතට ටිකින් ටික ලන්වීමට උත්සාහ දැරූවෙමි.

ඔහුව මනා ලෙස තේරුම් ගතිමි.
මම ඔහුට ආදරය කලෙමි.
ඔහු ගැන මා උනන්දු බව ඇඟවූවෙමි.
ඔහු මා ළඟට ගෙන පාඩම් වැඩ කියා දුනිමි.
ඔහුට අලුත් ඇඳුම්ද සපත්තුද රැගෙන දුනිමි.
මම රැගෙන එන ආහාර වලින් ඔහුටද කොටසක් ලබා දුනිමි.

එම වසරේ තුන්වන වාරයේ නිවාඩු ලබා දෙන දිනය ලඟාවිය. එදින ළමුන් සියලු දෙනා කුමක් හෝ පොඩි ත්‍යාගයක් මා වෙත ලබා දුන්නා.

කන්නාද කුමක් හෝ දෙයක් කඩදාසි මල්ලක දමා ගෙනැවිත් මා අත තැබුවා.

මා ළමුන් දුන් තෑගි එකින් එක ළමයි ඉදිරියේම දිගහැර බලමින් ඔවුන් සමග සතුටු වුණා.
ඒ අතර ළමයි විසින්ම අඳින ලද චිත්‍ර සාදන ලද අත්කම් ටොෆීවර්ග හා චොකලට් වර්ගද විය.

කන්නා දෙන ලද බෑගය විවෘත කල පසු එහි වූයේ ගල් හැලී ගිය අත්පලඳනාවක්
අඩක් හිස් කල පුයර බෝතලයක් හා
කුඩා ප්‍රමාණයක් ඉතිරි වූ හිස් සුවඳ විලවුන් බෝතලයකි.

ළමුන් සියලු දෙනා හයියෙන් සිනාසෙන්නට පටන් ගත් අතර
මා ඔවුන් නිශ්ශබ්ද වන ලෙස පවසා කන්නා දෙස බැලුවා.

ඔහු ඉතා අහිංසක ලෙස මා දෙස බලා සිටින අයුරු මම දුටුවා.

ඔහු මට දෙනු ලැබූ අත්පළඳනාව මම මාගේ දෑතේ පැළඳ ගත්තා.

සුවඳ විලවුන් බෝතලයෙන්ද  බිංදු කීහිපයක් මාගේ මැණික් කටුව ආසන්නයේ ආලේප කර ගත්තා.
එයින් ඉතා සුමුදු සුවදක් හමන්නට වූණා.

කාන්නාගේ මුහුණේ ලස්සන සිනහවක් ඇඳී ඇති අයුරු මට ඈතින් පෙණුනා.

පන්තියේ ළමයි සියලු දෙනාම මාගෙන් සමුගෙන ගිය පසු කන්නා මා වෙත පැමිණි මෙසේ පැවසුවා.

“ටීචර් ඔයා අද මගේ අම්මා වගේ සුවඳයි.”
''මම ඔයාට ආදරෙයි''.

මාගේ හදවතට දැඩි වේදනාවක් දැණුනා . මෙම දරුවාට අම්මාගේ ආදරය නැති වීම දැඩි සේ බලපා ඇති බව මා හට වැටුහුණා.
නිවසට ගියද මාහට කන්නා පිළිබඳ මතකය මාසය පුරාම තිබුණා.

කෙමෙන් කෙමෙන් පාසල් නිවාඩුව ද අවසන් වුණා.
දරුවන් නැවත පාසලට පැමිණෙන දිනයද **උදා** වුණා .

මෙම දරුවන්ට ගැන්වීමේ කටයුතු පමණක් සිදු කිරීම ප්‍රමාණවත් නොවන බව මම නිවාඩු කාලය පුරාවට සිතුවා. මෙම දරුවන්ට  දැඩි ලෙස ආදරය ලබා දීම මඟින් ඔවුන්ගෙන් ලබා ගත හැකි බොහෝ දේ ඇති  බව මා වටහා ගත්තා.

''කන්නා'' දුන් අත් පළඳනාව හා සුවඳ විලවුන් ගල්වාගෙන පැමිණ මා දෙස බැලු කන්නගේ මුහුණේ ආදරණීය සිනහවක් ඇඳි තිබුණා.

පසුගිය වසරේ පැවති ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල ද පැමිණ තිබුණා.
මාගේ දරුවන් සියලු දෙනාම ශිෂ්‍යත්ව විභාගය සමත් වී තිබූ අතර ''කන්නා'' ඉතා ඉහළ ලකුණක් ලබාගෙන තිබුණා.

කාලය කෙමෙන් ගෙවී ගියා.
5 ශ්‍රේණිය සහ 6 ශ්‍රේණිය වර්ෂ දෙකේම මටම බාර වූ පන්ති වුණා.
කන්නා ද වෙනස් ළමයෙක් වුණා.
මගේ පන්තියෙන් කන්නා පිටව ගියද කන්නාගේ අධ්‍යාපන කටයුතු සහ ඔහු ගැන සොයා බැලීම මම දිගටම කළා.
ඔහු නැවතත් ඉගෙනීමේ දක්ෂතා පෙන්නුම් කළා.

ඔහු මහන්සි වී පාඩම කළා.
හොඳින් වැඩ කටයුතු කරගෙන ගියා.
නිතරම මා ඔහු පිළිබඳ සොයා බැලුවා.

කාලය ගෙවෙද්දී කන්නා අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් ද අ.පො.ස (උ.පෙළ) විභාගයද උසස් ලෙස සමත්ව වැඩිදුර අධ්‍යාපනය සඳහා විශ්ව විද්‍යාලයට තේරී පත්වුණා.

මේ සියලුම අවස්ථා වලදී මා ඔහුට උපරිමයෙන් උදව් කලා.

විශ්ව විද්‍යාලයට තේරුණු දිනයේ ඔහු මා සමඟ ඒ සතුට බෙදා ගැනිමට පැමිණ සිටි අතර මා ද ඉතාමත් සතුටට පත් වුණා.

විශ්ව විද්‍යාල ගමනින් පසු ''කන්නා'' සහ මා අතර තිබු සම්බන්ධතාවය කෙමෙන් නැති වී ගියා.

දිනක් මා නිවසේ හුදකලාවේ සිටි අවස්ථාවක මාගේ නමින් ලිපියක් ලැබුණා.

මම එය විවෘත කර බැලුවා.
එය එවා තිබුණේ ''කන්නා'' විසිනි.
මට අදහාගත නොහැකි වුණා.
ඔහු තාමත් ඔහුගේ මතකයේ මා තබාගෙන තිබෙනවා .
ඔහු මා අමතක කර නැත .
ඔහු එම ලිපියෙන් පවසා තිබුණේ තමා වෛද්‍ය උපාධිය පළමු පන්තියෙන් පාස් වු බවකි.
ඔහුගේ උපාධි ප්‍රධානෝත්සවය සඳහා මා හට පැමිණෙන ලෙසත් එදිනට තමාගේ මව මෙන් පෙනී සිටින ලෙසටත්ය.
මාහට එය අදහා ගත නොහැකි විය.
ඔහු තවමත් මට ආදරය කරයි.

සතුට වැඩිකමට මාගේ දෙනෙත් තෙත් වුණා.

ලිපියේ සඳහන් කර ඇති දිනයේ වේලාවට කලින් මම එම විශ්ව විද්‍යාල පරිශ්‍රය වෙත ගියා.

මා එහි යන විට කන්නා විසින් මට තෑගි දෙනු ලැබු ගල් නොමැති අත්පළඳනාව පැළඳ ගිය අතර
විලවුන් බිංදු කිහිපයක් ද ගා ගෙන ගියෙමි.

මා එනතෙක් මග රැඳී සිටි ඔහු මා දුටු විගස මා ළඟට පැමිණ මා තරයේ වැළඳ ගෙන ඔහුගේ සතුට මා වෙත ප්‍රකාශ කලා. මට හඳුනාගත නොහැකි තරමටම ඔහු ලස්සන තරුණයෙකු වී සිටියා.

“ මා ඔබට සියල්ලට ණය ගැති ටීචර්''

“මම ඔයාට හැමදාමත් ආදරෙයි ’’
‘‘ඔයා හැමදාමත් මගේ අම්මා’’
ඔහු මා වැළඳගෙන කඳුලු සැලුවා.

කුඩා කල සිටම ආදරය ලැබුණු දරුවකු කවදාවත් නොමඟ නොයයි.
‘ආදරය’ සෑම දරුවෙකුගේම ජීවිතය වෙනස් මගකට යොමු කරයි.
මගේ ‘‘කන්නා’’ වෙනස් වුණේ මෙහෙම යි.
අපි සියලු දෙනාම එකිනෙකාට ආදරය කරමු.

-නිමි-



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දි මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලිකවද යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා ප්‍රංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගි ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රිය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පිවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

ISBN No. 978-624-208-802-0